ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2010

---------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

මාර්තු 31 දිනට පසු ලියාපදිංචි කරන සෑම පුවත්පතකින්ම ප්‍රමාද වන මසකට රු.100 බැගින් වූ ප්‍රමාද ගාස්තුවක් අය කළ යුතු වුවත්, පුවත්පත් 24 කින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හා එය ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණ.

1.2.2 **ලැබිය යුතු ගිණුම්**

-------------------

ලංකා පුවත් ආයතනයෙන් අයවිය යුතු රු.70,400 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

1.2.3 **විගණන සාක්ෂි**

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.6,025,608 ක් වූ ජ'නල් සටහන් 41 සඳහා ජ'නල් වවුචර් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මොණරාගල දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් සඳහා පැවති වැඩමුළුවේ ආහාර සඳහා රු.49,625 ක් වැය කර තිබූ බවට බිල්පත් ඉදිරිපත් කර තිබුණද, සහභාගි වූ සංඛ්‍යාව තහවුරු කර ගැනීම සඳහා පැමිණීමේ ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) පිරිවැය රු.167,069 ක් ව ස්ථාවර වත්කම් භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පොත්වලින් ඉවත් කිරීමට තීරණය කර පොත්වලින් ඉවත් කර තිබුණි. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාස යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1973 අංක 5 දරන පුවත්පත් මණ්ඩල පනතේ | |
| I 3 වන වගන්තිය (ආ) i | ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවේදීන්ගේ සංගම් විසින් නම් කරනු ලබන හත් දෙනෙකුට නොවැඩි මූල මණ්ඩලයකින් එක් අයෙකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| II 6 වන වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක සඳහා ගණපූර්ණය පස් දෙනෙකු සිටිය යුතු අතර, 2010 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 8 ක් පවත්වා තිබූ අතර, ඉන් අවස්ථා 7 කදීම එම අවශ්‍යතාවය සපුරා නොතිබුණි. |
| III 15 වන වගන්තිය හා දණ්ඩ නීති සංග්‍රහයේ 479 වන වගන්තිය | යම් පුවත්පතක් අසභ්‍ය කරුණක් හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 479 වන වගන්තිය යටතට ගැනෙන කරුණක් හෝ අශෝභන අශ්ලීල ප්‍රකාශනයක් පල කරන සෑම තැනැත්තෙකුටම රු.5,000 ක දඩයක් හෝ වසර 2 ක සිර දඬුවමක් නියම කළ හැකිව තිබුණද, එවැනි පුවත්පත් 06 කට එරෙහිව එය සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය | 2008 වර්ෂයෙන් පසුව වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී/12 චක්‍රලේඛය 8.3.4 ඡේදය | නිලධාරින්ගේ ජංගම දුරකථන ගාස්තු ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමට පෙර රු.17,689 ක් ගෙවීම කර තිබුණි. |
| (ඈ) | 2006 දෙසැම්බර් 12 දිනැති අංක ඩීඑම්එස්/ඒ/යූ/එම්අයිඑම්/19 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය | ජීවන වියදම් දීමනාව හැර වෙනත් දීමනා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් ගෙවිය යුතු වුවද, සම්මන්ත්‍රණ වැඩමුළු සඳහා රු.225,375 ක මුදලක් දීමනා ලෙස නිලධාරින් 09 ක් වෙත ගෙවීම් කර තිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි සංග්‍රහය I මු.රෙ. 371 | වර්ෂය අවසානයේදී සියළුම අත්තිකාරම් මුදල් නිරවුල් කළ යුතු වුවත්, රු.57,000 ක් වූ අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දින වන විට පියවා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.13,445,044 ක ඌනතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.12,556,000 ක ප්‍රදානයෙන් අනතුරුව එය රු.889,045 ක ඌනතාවයක්

විය. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයෙ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.7,749,658 ක ඌනතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා ලැබුනු රු.8,302,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොට ගෙන එය රු.552,342 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,441,387 ක පිරිහීම සඳහා කාර්යාල කුලී රු.790,000 කින් ද, ප්‍රචාරණ වියදම් රු.690,880 කින්ද වියදම් වැඩි වීම බලපා තිබුණි.

### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති මෙම මණ්ඩලය මගින් අපේක්ෂිත අරමුණු අතරින් වසර ගණනාවක සිට සිදුවනුයේ පුවත්පත් ලියාපදිංචිය පමණි. ඒසේ වුවද, මෙම ආයතනය පවත්වා ගෙන යාම සඳහා සේවක පඩිනඩි වලට අමතරව සමාලෝචිත වර්ෂයේදී රු.5,821,084 ක වියදමක් දරා තිබුණි. නමුත්, පුවත්පත් ලියාපදිංචියෙන් ලද ආදායම වූයේ රු.47,750 ක් පමණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂය තුළදී පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති පවත්පත් සංඛ්‍යාව 110 ක් වූ අතර, නියැදි පරීක්ෂාවට අනුව වෙළඳපොලේ අලෙවිය සඳහා පවතින තවත් පුවත්පත් 30 ක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) මාධ්‍ය සංවිධාන කිසිවක් ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) මාධ්‍යවේදී සම්මාන උළෙලක් පැවැත්වීම සඳහා රු. මිලියන 1 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, එය පවත්වා නොතිබුණි.

(ඇ) ජන සන්නිවේදන අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමා එක් අවුරුදු පාඨමාලාවක් රු.757,734 වැය දරා පවත්වා තිබූ නමුත්, ආරම්භයේදී සහභාගිකයන් 25 දෙනෙක් සහභාගී වුවද, මේ වන විට 23 ක් පමණක් සහභාගී වී තිබුණි. තවද, පාඨමාලා ගාස්තුව ලෙස එක් අයෙකුගෙන් රු.30,000 ක් බැගින් රු.750,000 ක් අය කළ යුතු වුවත්, රු.426,000 පමණක් ලැබී තිබුණි.

(ඉ) පොත් ප්‍රකාශන හා පර්යේෂණ සඳහා රු. මිලියන 01 ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත්, රු.108,740 ක් වැය දරා මාධ්‍ය සමීක්ෂණ පොත් 1000 ක් පමණක් මුද්‍රණය කර තිබුණි. තවද, මණ්ඩලයේ ග්‍රන්ථ අලෙවි අංශය මුද්‍රණය කරන ලද ග්‍රන්ථ 3,644 ක් දෙසැම්බර් 31 දින වන විටත් අලෙවි නොවී පැවතුණි.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස දිනපතා පුවත්පතක් සඳහා රු. 1,000 ක්ද, සතිපතා පුවතපත් සඳහා රු.500 ක්ද, අනෙකුත් පුවත්පත් සඳහා රු.250 ක්ද ලෙස 1994 පෙබරවාරි 15 දින සිට අයකරන අතර, එදිනෙන් පසුව එනම්, වසර 16 කින් සංශෝධනය කර නොතිබුණි.

(ආ) 2009 සැප්තැම්බර් 07 දින රු.1,619,051, සියයට 14 ක පොලී අනුපාතයකට මහජන බැංකුවේ වසර 3 ක කාලයක් සඳහා ආයෝජනය කර 2011 මාර්තු එය අවලංගු කර තිබුණි. ඵලදායී තීරණ නොගැනීම හේතුවෙන් ආයතනයට රු.173,168 ක පාඩුවක් සිදු වී තිබුණි.

### 2.2.3 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව එක් රියදුරකු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර, එම සේවකයගේ වැටුප් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.259,560 ක් මණ්ඩලය විසින වැයකර තිබුණි.

### 2.2.4 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) පුවත්පත් මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2009 ඔක්තෝබර් 07 දිනැති අංක 1880 දරණ ගිවිසුම අනුව, වසරකට රු.1,380,000 ක් ගෙවා කුලියට ලබාගත් ගොඩනැගිල්ලෙහි තාප්පය කපරාරු කිරීම, පින්තාරු කිරීම හා කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් 2009 දෙසැම්බර් 29 දින රු.86,896 ක වියදමක් දරා තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුවේ සීඑම්/සීඑම්සී/ආර්සී/224 තක්සේරු වාර්තාව අනුව සියළු අළුත්වැඩියා වියදම් දේපළ හිමිකරු විසින් දැරිය යුතු බවට ගිවිසුම් කොන්දේසි ඇතුළත් කළ යුතු වුවත, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් මෙම මුදල අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ)	තවද, නිලධාරීන් 14 ක් සේවය කරන මෙම ආයතනයට වසර 27 ක කාලයක සිට කුලී ගෙවමින් විවිධ ස්ථානවල කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. මේ පිළිබඳව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ අවධානය යොමු කරවා සුදුසු කාර්යාල ස්ථානයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 විගණන හා කළමනාකරණ කමිටු

---

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී / 12 හි 7.4.1 හා 7.4.2 ඡේද ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 2.2.6 අයවැය ලේඛනමය පාලනය

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ)	2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී / 12 හි 5.2.3 ඡේදයට පටහැනිව 2010 වසරට අදාල අයවැය ලේඛණය වසරක ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි.

(ආ)	අයවැය ගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ)	අයවැය
(ආ)	ආදායම්
(ඇ)	ධාවන සටහන් පවත්වාගෙන යාම
(ඈ)	පැමිණිලි විභාග කිරීම
(ඉ)	පුවත්පත් ලියාපදිංචිය
(ඊ)	ආරක්ෂණ සේවය